# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,112- 2019 පෙබරවාරි මස 22 වැනි සිකුරාදා - 2019.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 504 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මාර්තු මස 15 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මාර්තු මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2019

01. බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ පහත තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1.1 | කොහු උපදේශක | - | 01 |
| 1.2 | දැව උපදේශක | - | 03 |
| 1.3 | ලුහු උපදේශක | - | 01 |
| 1.4 | සම් උපදේශක | - | 01 |
| 1.5 | පරිගණක උපදේශක | - | 01 |
| 1.6 | පේෂ උපදේශක | - | 13 |
| 1.7 | කාර්මික උපදේශක | - | 01 |

02. *පුරප්පාඩු සංඛ්‍යාව* - 21

03. *අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය* - 2019.03.31

04. *පොදු කොන්දේසි.-*

4.1 අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
4.2 2019.03.31 වැනි දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.
4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි අයට ඉල්ලුම් කළ හැකි ය. පුරප්පාඩු සඳහා බඳවා ගනුලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතු ය.
4.4 මනා චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

05. *සේවා කොන්දේසි.-*

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතු වේ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු වේ. රජය මගින් ඒ ඒ අවස්ථාවල දී නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු වේ. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

බඳවා ගන්නා නිලධාරීන් බස්නාහිර පළාත තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට යටත් වේ.

06. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.චි. 03/2016 අනුව,

රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540 (වැටුප් කාණ්ඩය - MN-1)

07. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්.-*

7.1 *අධ්‍යාපන සුදුසුකම්.-*

*(අ)* අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ ඇතුළුව විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව ගණිතය ඇතුළුව විෂයයන් 06 ක් සමත් වීම. (එකවරකදී අවම වශයෙන් විෂයයන් 05 ක් වත් සමත් වී තිබිය යුතු ය.)

*(ආ)* ලුහු ඉංජිනේරු උපදේශක වෘත්තීන් සඳහා අයදුම් කිරීමේදී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබීම අනිවාර්යය වේ.

7.2 *වෘත්තීය සුදුසුකම්.-*

ඉල්ලුම් කරන ක්ෂේත්‍රයට අදාළව රජයේ හෝ රජයේ පිළිගත් ආයතනයක පහත සඳහන් පුහුණු පාඨමාලාවක් හදාරා අවසන් සහතික පත්‍ර ලබා තිබීම.

| *අනු අංකය* | *තනතුර* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| 01. | දෘව උපදේශක (වඩු කර්මාන්ත) | රජයේ හෝ රජයේ පිළිගත් වඩු කර්මාන්ත පුහුණු ආයතනයක එක් අවුරුදු වඩු පාඨමාලාව/එක් අවුරුදු වඩු කර්මාන්ත උසස් පුහුණු පාඨමාලාව හදාරා අවසන් සහතික පත්‍රය ලබා තිබීම. |
| 02. | ලුහු ඉංජිනේරු උපදේශක | රජයේ හෝ රජයේ පිළිගත් ලුහු ඉංජිනේරු පුහුණු ආයතනයක අවම වශයෙන් එක් අවුරුදු පාඨමාලාවක් හදාරා අවසන් සහතික පත්‍රය ලබා තිබීම. |
| 03. | සම්, මැටි, කොහු උපදේශක | ඒ ඒ වෘත්තීන්ට අදාලව රජයේ හෝ රජයේ පිළිගත් පුහුණු ආයතනයක හය මාසික හෝ ඊට වැඩි පාඨමාලාවක් හදාරා අවසාන සහතික පත්‍රය ලබා තිබීම. |
| 04. | පරිගණක උපදේශක | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසරක පරිගණක ඩිප්ලෝමාවක් හදාරා අවසාන සහතිකය ලබා තිබීම,<br><br>*හා*<br><br>තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක පරිගණක උපදේශක වශයෙන් වසර 02 කට නොඅඩු කාලයක් සේවය කර තිබීම. |
| 05. | පේෂකර්ම උපදේශක | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දෑ අවුරුද පාඨමාලාව හදාරා අවසාන සහතික පත්‍රය ලබා තිබීම<br><br>හෝ<br><br>පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ හය මාසික පාඨමාලාවක් සමග පේෂ කර්මාන්ත/බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන ආයතනයක කාර්මිකයකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් ලබා තිබීම. |
| 06. | කාර්මික උපදේශක | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක යාන්ත්‍රීකරණය පිළිබඳ වසර 2 1/2 ක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br><br>***සටහන.***- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික - 4 වන මට්ටම ( NVQ 4) හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම අවශ්‍ය වේ. |

(සියලු අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් 2019.03.31 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

08. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

8.1 පුරප්පාඩු සංඛ්‍යාව නොඉක්මවා අයදුම්පත් ලැබුණහොත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව සුදුස්සන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

8.2 පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්පත් ලැබුණහොත් ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා අනුපිළිවෙල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

8.2.1 *ලිඛිත විභාගය.-*

| *අනු. අංකය* | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය දැනීම | පැය 01 යි | 100 | 40 |
| 02 | බුද්ධි පරීක්ෂණය | පැය 01 යි | 100 | 40 |

8.2.2 *විභාගය සඳහා වන විෂය නිර්දේශය.-*

| *අනු. අංකය* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | සාමාන්‍ය දැනුම | ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, ආර්ථික වශයෙන් අදාළ කරුණු පිළිබඳ අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ. |
| 02 | බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු කරුණු නිවැරදි හා තර්කානුකූල ලෙස අවබෝධකර ගැනීමේ බුද්ධිය හා ගණිතමය හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ. |

09. *විභාග ගාස්තු :*

9.1 විභාග ගාස්තුව රු. 600 කි. විභාග ගාස්තු බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බප 1 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතු ය. මෙසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කවර හෝ කරුණක් නිසා විභාගයට පෙනී නොසිටින හෝ අයදුම්පත් ඉවත් කර ගන්නා අයදුම්කරුවන්ට හා විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොමැති බව හෙළිවන අයදුම්කරුවන්ට විභාග ගාස්තු සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද, මෙම විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු වෙනත් විභාගයක් වෙනුවෙන් පැවරීමට ද නොහැකිය.

9.2 අයදුම්කරුවන් තම අයදුම්පත මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත අනුව, ඒ - 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ යුතු ය. ඉල්ලුම්පත අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍යයෙන්ම විය යුතු ය.

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් 2019.03.31 දිනට පෙර ආයතන ප්‍රධානියා මගින් අදාළ අමාත්‍යාංශ ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

9.3 අයදුම්කරුවන් අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

කේ. චම්පා එන්. පෙරේරා,
ලේකම්,
පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ,
නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ
ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

ආදර්ශ අයදුම්පත්‍රය

*බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2019*

විභාග අංකය : ☐
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

(නිලධාරියා විසින් සම්පූර්ණ කිරීම සඳහා)

☐

අයදුම් කරන තනතුර

01. i. මුලකුරු සමඟ නම (සිංහලෙන්) :..............................................................

ii. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :..............................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

iii. සම්පූර්ණ නම (සිංහලෙන්) :..............................................................

iv. සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :..............................................................

v. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

02. i. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :..............................................................

ii. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසියෙන්) :..............................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

iii. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අදාල කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2019.03.31 දිනට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය :

අවු. :......................, මාස :.........................., දින :............................

v. දුරකථන අංකය :

පෞද්ගලික :........................................ රාජකාරි :........................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

04. i. උපන් දිනය :

වර්ෂය :..........................., මාසය :........................, දිනය :.......................,

ii. 2019.03.31 දිනට වයස :

අවුරුදු :..........................., මාස :..........................., දින :...........................,

05. විභාගයට පෙනී සිටින මාධ්‍යය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

06. *අධ්‍යාපන සුදුසුකම්* : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 07 අනුව)

6.1 *අ.පො.ස. (සා. පෙළ) විභාගය :*

වර්ෂය :........................ විභාග අංකය :....................... වර්ෂය :........................ විභාග අංකය :........................

| *අනු අංකය* | *විෂය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |
| 05. | | |
| 06. | | |
| 07. | | |
| 08. | | |

| *අනු අංකය* | *විෂය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |
| 05. | | |
| 06. | | |
| 07. | | |
| 08. | | |

6.2 නිවේදනයේ 07 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාල වෘත්තීය හා පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් :

6.2.1 පුහුණු පාඨමාලාවේ නම :..........................................................................
පුහුණු කාල සීමාව :................................................ සිට ................................................
ආයතනය :..........................................................................
සහතිකය වලංගු වන දිනය :..........................................................................

6.2.2 පළපුරුද්ද පිළිබඳ විස්තර :
ආයතනයේ නම :..........................................................................
කාල සීමාව :.............................................. සිට .............................................. දක්වා

07. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත් අංකය :..........................................................................
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..........................................................................
දිනය :..........................................................................

| |
|---|
| මෙහි ලදුපත නොගැලවෙනසේ අලවන්න. |

08. ..........................................................................වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළි වුවහොත් බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මා හොඳාකාරවම දනිමි.

.......................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..................................

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* (අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................................................... මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ..................................................................... දින මා ඉදිරිපිටදී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :.....................................................................................................................
අත්සන :.....................................................................................................................
තනතුර හා නිල මුද්‍රාව :.....................................................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 2,37,060 නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

02-649

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.